# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2039/5 - 2017 ඔක්තෝබර් මස 03 වැනි අඟහරුවාදා - 2017.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී - 9/73

**(469 වන අධිකාරය) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

2 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ වූ නියමය

(469 වන අධිකාරය) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 2 වන වගන්තියේ (2) වන උප වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා වන මා විසින්, මේ නියමය මගින් එකී ආඥා පනතේ කාර්ය සඳහා මෙහි උප ලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ප්‍රදේශය අභය භූමියක් බවට ප්‍රකාශයට පත් කරනු ලබන අතර, එම අභය භූමිය ''කොඩිගහකන්ද අභය භූමිය'' ලෙස හඳුන්වනු ලබන සහ සලකනු ලැබිය යුතු බවට, මේ නියමය මගින් තවදුරටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ගාමිණී ජයවික්‍රම පෙරේරා,
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය.

2017 අගෝස්තු මස 16 වැනි දින,
බත්තරමුල්ල,
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

***කොඩිගහකන්ද අභය භූමියේ සීමා***

බස්නාහිර පළාතේ කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හෙක්ටයාර 12.63කින් සමන්විත වූද, පහත සඳහන් මායිම් වලින් සමන්විත වන්නා වූ ද, භූමි ප්‍රදේශය -

*උතුරු මායිම* - අමාරිස් මහතාගේ අත්හරින ලද ගල් කොරිය ආසන්නයේ පිහිටි බණ්ඩාංක උ 175971 නැ 116048 වන ආරම්භක ලක්ෂ්‍යයේ සිට බණ්ඩාංක උ 175980 නැ 116124 වන ලක්ෂ්‍යය හරහා ''පොල්කොට බෝක්කුව'' ආසන්නයේ පිහිටි බණ්ඩාංක උ 175991 නැ 116160 වන ලක්ෂ්‍යය දක්වා ද වේ.

*නැගෙනහිර මායිම* - අවසන් වරට සඳහන් කරන ලක්ෂ්‍යය වන බණ්ඩාංක උ 175991 නැ 116160 සිට ''තැඹිලි දොල'' ඔස්සේ බණ්ඩාංක උ 175915 නැ 116177 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට අතුරු මාර්ගය ඔස්සේ බණ්ඩාංක උ 175666 නැ 116245 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට උඩබංගලා යටිපාර හමුවන බණ්ඩාංක උ 175653 නැ 116277 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට සෘජු සරල රේඛාවක් ඔස්සේ දකුණු දෙසින් පිහිටි ''ටී ජොයින්ට්'' ආසන්නයේ පිහිටි බණ්ඩාංක උ 175591 නැ 116285 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට නිරිත දෙසින් පිහිටි බණ්ඩාංක උ 175532 නැ 116248 වන ලක්ෂ්‍යය හරහා වලව්ව සහ කොඩිගල කන්ද මායිමෙහි පිහිටි බණ්ඩාංක උ 175503 නැ 116202 හා බණ්ඩාංක උ 175458 නැ 116140 වන ලක්ෂ්‍යය හරහා බණ්ඩාංක උ 175415 නැ 116106 වන ලක්ෂ්‍යය පිහිටි ''ගල් ටැංකිය'' හමුවන තෙක් ද වේ.

**උපලේඛනය** (සම්බන්ධිතයි)

*දකුණු මායිම* - අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යය වන බණ්ඩාංක උ 175415 නැ 116106 වන ලක්ෂ්‍යයේ සිට බස්නාහිර දෙසට ''ටැංකිදොල'' මායිමෙහි පිහිටි බණ්ඩාංක උ 175418 නැ 116081 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට නිරිත දෙසින් පිහිටි බණ්ඩාංක උ 175370 නැ 116004 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට වයඹ දෙසට වන්නට පිහිටි බණ්ඩාංක උ 175382 නැ 115953 වන ලක්ෂ්‍යය හරහා බණ්ඩාංක උ 175404 නැ 115908 වන ලක්ෂ්‍යය දක්වා ද වේ.

*බස්නාහිර මායිම* - අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යය වන බණ්ඩාංක උ 175404 නැ 115908 වන ලක්ෂ්‍යයේ සිට ඊසාන දෙසින් පිහිටි ''සඳුන් උයන'' පන්සල අසල ගල් කොරිය මායිමේ පිහිටි බණ්ඩාංක උ 175424 නැ 115940 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට ඊසාන දෙසින් පිහිටි බණ්ඩාංක උ 175449 නැ 115963 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට උතුර දෙසින් පිහිටි අමාරිස් මහතාගේ වැඩිමහල් පුතුගේ ගල් කොරියෙහි මායිමෙහි පිහිටි බණ්ඩාංක උ 175496 නැ 115963 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට උතුර දෙසින් පිහිටි බණ්ඩාංක උ 175517 නැ 115963, බණ්ඩාංක උ 175595 නැ 115980 යන ලක්ෂ්‍යය හරහා බණ්ඩාංක උ 175688 නැ 116000 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට ඊසාන දෙසින් පිහිටි බණ්ඩාංක උ 175735 නැ 116036 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට උතුරු දෙසින් පිහිටි බණ්ඩාංක උ 175812 නැ 116040, බණ්ඩාංක උ 175895 නැ 116037 වන ලක්ෂ්‍යය හරහා ගල් කොරිය ආසන්නයේ පිහිටි ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

10-534

## PROPOSED OLABODUWA KODIGAHAKANDA SANCTUARY




**Legend**

- Proposed Sanctuary Boundary
- Main Road
- Minor Road
- Sanctuary Area ( Area 12.63 ha )
- GPS Coordinate
- Community Halle
- Bungalow ( Walawwa )
- Water Tank
- Pond
- Gal Corri

N

SCALE 1:7,000

GIS Unit
Department of Wildlife Conservation



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.